12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 9th March 2021 |
|---|---|---|---|

පැමිණිලිකරු : මිල්ටන් ජයරත්න මයා,
500/75,රුවන්පුර පෙදෙස,
අග්ගොන,අංගොඩ.

වගඋත්තරකරුවන් : 01. සමූපකාර සංවර්ධන කොමසාරිස්,
බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ.අංක: 444, ආදිපාද වීදිය,
කොළඹ 01.

02. සභාපති,
සී/ස කොළොන්නාව විවිධ සේවා සමූපකාර සමිතිය,
224, කොලොන්නාව පාර,
කොලොන්නාව.

<u>පැමිණිලි අංක : **HRC**/3852/14</u>

පැමිණිල්ල -:

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, සිදුකරන ලද විගණනයේදී වැරදි ගැලපිලි සටහන් යෙදීම මගින් කොමසාරිස්වරයා විසින් සමූපකාර සමිති ප්‍රඥප්තියේ අංක 44:6 (අ) සහ (ආ) වගන්ති වල සඳහන් විධිවිධානයන්ට හා නියමයන්ට පටහැනිව සහ එම නියමයන් නොසලකා හරිමින් තමාහට හිමිකම ඇති පරිපාටිමය රැකවරණයන් සලසා නොදෙමින්, තමාගෙන් රුපියල් ලක්ෂ 52,59,921.95 ක මුදලක් අයවිය යුතු බවට දැක්වීම මත තමාට කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී කටයුතු කළ බවයි.

ඒ අනුව තමාගේ කීර්තිනාමයට සිදුවූ හානිය වෙනුවෙන් 1 වන වගඋත්තරකරුගෙන් රුපියල් 50,00,000/- ක වන්දියක් ලබා දෙන ලෙසට පැමිණිලිකරු ඉල්ලා ඇත.

**පැමිණි ලේ වැඩිදුර කරුණු දැක්වීම :-**

පැමිණිලිකරු, සී/ස කොළොන්නාව විවිධ සේවා සමුපකාර සමිතියෙහි හිටපු සාමාන්‍යාධිකාරි/ ප්‍රධාන විධායක නිලධාරියා වන බවත්, ඔහු 1984.02.15 වන දින සිට, 2008.06.27 වන දින අනිවාර්ය විශ්‍රාමයැම දක්වාම, ආසන්න වශයෙන් වසර විසි පහක් පුරාවටද, එතැන් සිට 2008.06.07 වන දින සිට 2009.09.07 දක්වා කොන්ත්‍රාත් පදනමින් ද මෙම තනතුර දරන ලද බවත් දක්වා ඇත.

2014.03.17 වන දින, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ප්‍රකාරව ඉහත සඳහන් මුදල ඉල්ලා පැමිණිලිකරුට සහ සමුපකාර සමිතියේ හිටපු සභාපති වෙත එන්තරවාසි නිකුත් කර ඇති අතර, නිශ්චිත දිනයට පෙර එම මුදල ගෙවීමට ඔවුන් අපොහොසත් වුවහොත්, 1998 අංක: 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 58 වගන්තිය යටතේ බේරුම්කරණය පිණිස මෙම ආරාවුල 1 වන වගඋත්තරකරුට යොමු කෙරෙණ බවද එකී එන්තරවාසිවල 03 වන වගන්තියෙන් දැනුම්දී ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු දක්වා ඇති පරිදි, ඔහුට විරුද්ධව නිකුත් කර ඇති එන්තරවාසිය පදනම්ව ඇත්තේ 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් පනවන ලද අධිභාර මුදල මත වේ. කෙසේවුවද, පැමිණිලිකරුගේ තර්කය වන්නේ, 1998 අංක: 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති (සංශෝධිත) ව්‍යවස්ථාවේ අධිභාරයන් පාලනය වන විධිවිධාන යටතේ තමන්ට හිමි රැකවරණයන් තමන්ට අහිමි කරන ලද බවය. පැමිණිලිකරු විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, තමාගේ අයිතිවාසිකම් උල්ලංඝනය විභාග කරන ලෙස සහ එකී ව්‍යවස්ථාවෙහි 44(6) වගන්තිය යටතේ තමන්ට ඇති අයිතිය ප්‍රකාර, හේතුපාදක වූ කරුණු හෙළි කරන ලෙසයි.

බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 44(6)(ඒ) කොටසට අනුව, "කිසියම් හෝ අවස්ථාවක සමිතියෙහි නිලධාරියෙකු හෝ සේවකයෙකුව සිටි ; කිසියම් පුද්ගලයෙකු නීතියට පටහැනි ලෙස සමිතියේ මුදල් භාවිතයට ගෙන ඇති බවට විගණනයකින් පසු හෙළිවුවහොත්, රෙජිස්ට්‍රාර් විසින් එවන් මුදල් භාවිතයට ඉඩ නොදිය යුතු අතර, එවන් මුදල් භාවිතයන් සිදු කරන හෝ භාවිතයන්ට බලය දෙන

පුද්ගලයාගෙන් එකී මුදල් අයකර ගත යුතු අතර එවන් පුද්ගලයෙකුගෙන් අයකර ගතයුතුව ඇති මුදල සහතික කර, ඔහුගේ තීරණය ලිඛිතව එකී පුද්ගලයාට දැනුම් දිය යුතුය." වශයෙන් දක්වා ඇත.

කෙසේවුවද, ඒ හා සමඟම බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 44(6)(බී) කොටසේ, සඳහන් වන්නේ "කිසියම් පුද්ගලයෙකුට විරුද්ධව අධිභාරයක් පැනවීමට පෙර රෙජිස්ට්‍රාර් හෝ බලය පවරා ඇති කිසියම් පුද්ගලයෙකු හෝ, එවන් පුද්ගලයින්ට ඇහුම්කන්දීමේ හෝ යෝග්‍යයැයි ඔහුට හැඟීයන කරුණු සම්බන්ධයෙන් කිසියම් හෝ නියෝජනයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසා දිය යුතු අතර, එවන් අධිභාරයක් පනවන අවස්ථාවකදී, එවන් පුද්ගලයෙකු විසින් තමා වෙත ඉදිරිපත් කරනු ලබන එකී කාර්යය සඳහා වූ ඉල්ලීමක් මත, එකී ඉඩ නොදීම් හෝ අධිභාරයන් සම්බන්ධයෙන්වූ තම තීරණයට හේතු පාදක වූ කරුණු ලිඛිතව ඔහුට සැපයිය යුතුය." යනුවෙනි. පැමිණිළිකරු කියා සිටිනු ලබන්නේ 44(6) කොටස යටතේ, තමාට ඇහුම්කන්දීමේ අවස්ථාවක් ලබා නොදෙන ලද බවයි.

වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-

1 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීමට අනුව, 2007/2008 මුදල් වර්ෂවල වාර්ෂික විගණනයෙන් පසු යම් යම් ගිණුම්කරණ විෂමතා (එනම්, සමිතියේ නමින් සණස සංවර්ධන බැංකුවෙහි පවත්වා ගෙන ලද ඉතිරිකිරීමේ ගිණුමක් සමිතියේ ගිණුම් පොත්වල පිළිබිඹු නොකර ඇති බව හෙළිවීම) අනාවරණය වීමෙන් පසු, 1 වන වගඋත්තරකරු විසින් බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ <u>44 වන කොටස යටතේ</u>, සමිතියේ ගිණුම් පිළිබඳ ව්‍යවස්ථාපිත විගණනයක් 2012.05.14 වන දින ආරම්භ කර ඇති බවට දක්වා ඇත.

මෙම ව්‍යවස්ථාපිත විගණයෙන් වෙනත් කරුණු අතර, පහත දැක්වෙන කරුණු අනාවරණය වී ඇත.

අ) සඳහන් නොකරන ලද, ගණන් හිලව් නුදුන් ගනුදෙනු 1998 සහ 2009 අතර කාල පරාසය පුරා පැතිර ඇති වග;

ආ) ප්‍රශ්නගත ගිණුම, පැමිණිළිකරු සහ සමිතියේ හිටපු සභාපති, කේ.ලියනගේ මහතා විසින් 1998.12.10 දින විවෘත කර ඇති වග:

ඇ) ගිණුම විවෘත කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොමසාරිස්/රෙජිස්ට්‍රාර් යන දෙපාර්ශ්වයෙන්ම පූර්ව අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය ඇතුළු නියමිතව ඇති ක්‍රියා පිළිවෙත් වලට අනනුගතව සිදු කර ඇති බව; සහ

ඈ) අදාළ නොවන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් බැංකුවට අවනිදේශනය කරමින් ගිණුම විවෘත කර ඇති වග.

විගණන නිලධාරීන් විසින්, 2012.07.12 වන දින ස්වකීය විගණන වාර්තාවෙහි සමිතියේ පොත්වල අඩංගුව නොමැති වාර්තා සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකරු දැනුවත් කර ඇති අතර, ප්‍රශ්නගත ඉතිරිකිරීමේ ගිණුම යටතේ අයවිය යුතු මුදල් පැමිණිළිකරුට සහ කේ.ලියනගේ මහතාට බැර කිරීම මගින් සමිතියේ පොත්වල ඇති අතපසුවීම් නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇති බවද දක්වා ඇත. ගිණුම්කරණ විෂමතාවයන්ට මගපාදමින් සිදු කරන ලද මෙම වංචාසහගත ක්‍රියාවන්ට පැමිණිළිකරු සහ කේ.ලියනගේ මහතා වග කිවයුතු බව විගණන වාර්තාවෙහි පැහැදිලිවම හඳුනාගෙන ඇති බවද දක්වා ඇත.

වගඋත්තරකරු දක්වා ඇති පරිදි, 2012.08.09 වන දින සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන වාර්තාව සහ එහි අන්තර්ගත නිර්දේශයන් සැළකිල්ලට ගෙන, ඒවා අනුගමනය කිරීමට තීරණය කර ඇති බවත්, එකී අනුගතවීමට අනතුරුව ප්‍රශ්නගත මුදල පැමිණිළිකරුට සහ කේ.ලියනගේ මහතාට අධිභාරගත කර ඇති බවද දක්වා ඇත.

ප්‍රශ්නගත මුදල අයකර ගැනීම පිණිස 2 වන වගඋත්තරකරු විසින් පැමිණිළිකරු සහ කේ.ලියනගේ යන දෙපාර්ශවයටම 2014.03.17 වන දින එන්තරවාසි නිකුත්කර ඇති බවත්, නිශ්චිත දිනයට පෙර නිශ්චිත මුදල ගෙවීමට ඔවුන් අපොහොසත් වුවහොත්, 1998 අංක: 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 58 වගන්තිය යටතේ බේරුම්කරණය පිණිස මෙම ආරවුල 1 වන වගඋත්තරකරුට යොමු කෙරෙන බවත්, එකී එන්තරවාසිවල 03 වන වගන්තියෙහි ඔවුන්ට දැනුම්දී ඇති බවත් දක්වා ඇත.

ඔවුන් සහ පැමිණිළිකරු අතර කාරණය, 1998 අංක: 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 58 වගන්තිය යටතේ, බේරුම්කරණය පිණිස යොමු කරන මෙන් ඉල්ලා ඇති 2 වන වගඋත්තරකරුගේ දින රහිත ලිපියක් 1 වන වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇත. මෙම බේරුම්කරණ ක්‍රියාදාමයේ වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව නොමැති අතර, 1 වන

වගඋත්තරකරු කියා සිටිනු ලබන්නේ බේරුම්කරණ ක්‍රියාදාමය මඟින් පැමිණිලිකරුට ඇහුම්කන්දීමේ අවස්ථාව උදාකර දියහැකිව තිබූ බවයි. එසේම, ව්‍යවස්ථාවේ 58(3) වගන්තිය යටතේ, බේරුම්කරණයේදී 1 වන වගඋත්තරකරු හමුවේ අභ්‍යන්තර අභියාචනයක් කිරීමේ අයිතිය පැමිණිලිකරුට හිමි අතර, පැමිණිලිකරු වෙතින් මෙම ඉඩ ප්‍රස්තාව අහිමි වී නොමැති බවටද දක්වා ඇත.

බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 58 (4) වගන්තිය යටතේ සඳහන්ව ඇත්තේ "(3) අනුවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත ආයාචනයක් කර ඇති කිසිම පාර්ශවයක් එවන් ආයාචනයක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් හමුවේ පෙනී සිටීමට හෝ ඔහු විසින් ඇහුම්කන්දීමේ අවස්ථාවකට හිමිකම් නොදරණ බවයි."

44 වන වගන්තිය යටතේ පැමිණිලිකරු විසින් ඉල්ලා සිටිනු ලබන කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාව සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකරු කියා සිටිනු ලබන්නේ, ඔහු 44 වන වගන්තිය යටතේ ක්‍රියා නොකරන ලද බවත්, ව්‍යවස්ථාපිත විගණනයෙහි ප්‍රතිඵලය තහවුරු කර ගැනීම පිණිස බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 47(2) වගන්තිය යටතේ විමර්ශනයක් කරන ලද බවත්, එකී විමර්ශනය යටතේ පැමිණිලිකරුගේ ප්‍රකාශයන් වාර්තා කර ගන්නා ලද බවත්ය. කෙසේවුවද, 47(2) වගන්තිය යටතේ විමර්ශනය ආරම්භ කරන ලද්දේ 2010.06.23 වන දින (එනම්, ව්‍යවස්ථාපිත විගණනය පැවැත්වීමට සහ පැමිණිලිකරු වෙත අධිභාරය පැනවීමට වසර දෙකකටත් පෙර) බවද 1 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම්වලින් පෙනී යයි. ඒ හා සමානවම, මෙම විමර්ශනය යටතේ වාර්තා කර ගෙන ඇති පැමිණිලිකරුගේ ප්‍රකාශයන්හි පිටපත්ද පැහැදිලිවම 2010 වර්ෂයේ දාතම් සහිත බවට දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

අදාළ මුදල පැමිණිලිකරුට සහ තවත් එක් අයෙකුට අධිභාරගත කිරීමට පෙර, සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන වාර්තාව සහ එහි අන්තර්ගත නිර්දේශයන් සුපැහැදිලිව සළකා බලා ඇති බව නිරීක්ෂණය වේ. එකී විගණනය බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 44 වන වගන්තිය යටතේ පවත්වා ඇති බව විගණන වාර්තාවේ මෙන්ම ව්‍යවස්ථාපිත විගණනය ආරම්භ කරමින් 1 වන වගඋත්තරකරු විසින් නිකුත් කරන ලද ලිපියේද පැහැදිලිව සඳහන් වේ. ඒ අනුව, ප්‍රශ්නගත මුදල

පැමිණිලිකරුගේ නම ඉදිරියේ අධිභාරයක් ලෙස සඳහන් වීම බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 44 වන වගන්තිය යටතේ වූ ව්‍යවස්ථාපිත විගණනයක් මත පදනම් වූවකි.

අදාළ මුදල ඔවුන් වෙත අධිභාරගත කිරීමට පෙර, චූදිත පුද්ගලයාට ඇහුම්කන්දීමේ අවස්ථාවක් ලබාදීමේ අවශ්‍යතාවය 44 වන වගන්තියෙහි සුපැහැදිලිව සඳහන්ව ඇත. "යෝග්‍යයැයි ඔහු විසින් අදහස් කරනු ලබන....... කිසියම් නියෝජනයක් කිරීමට චූදිතයාට අවස්ථාව සලසාදීම රෙජිස්ට්‍රාර් විසින් කළ යුතු බවද" එම විධිවිධානයන්හිම දක්වා ඇත.

පැමිණිලිකරුට ලබා දෙන ලදැයි 1 වන වගඋත්තරකරු විසින් කියා සිටිනු ලබන ඇහුම්කන්දීමේ අවස්ථාව, බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 44 වන වගන්තියේ අවශ්‍යතාවයන් හා අනුකූල නොවන බවද නිරීක්ෂණය වේ.

- රෙජිස්ට්‍රාර් විසින් නියෝග කරන ලද විමර්ශනයකදී ප්‍රකාශයන් වාර්තා කර ගැනීම සිදුව ඇත්තේ, 2012 මැයි මාසයේදී ආරම්භ කරන ලද ව්‍යවස්ථාපිත විගණනයට පෙරය. 2012 වසරේදී ගොනු කරන ලද චෝදනාවන්ට ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව 2010 වර්ෂයේදී වාර්තා කර ගන්නා ලද ප්‍රකාශයක් මගින් චූදිතයෙකුට හිමිවූ බව කිව නොහැකිය.

- බේරුම්කරණ ක්‍රියාදාමයේ වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්වී නොමැති වුවද, කාරණය බේරුම්කරණය සඳහා යොමු කර ඇත්තේ, පැමිණිලිකරුට අධිභාරය පැනවීමෙන් සහ එන්තරවාසි නිකුත් කිරීමෙන් පසුව බව නිරීක්ෂණය වේ. ඒ අනුව, බේරුම්කරණ ක්‍රියාදාමය, එහි හරය කුමක් වුවද, සිදුව ඇත්තේ 44 වන වගන්තියේ විස්තරව ඇති අධිභාරය පැමිණිලිකරුට විරුද්ධව පැනවීමෙන් පසුවය. එහෙයින්, 44(6)(බී) වගන්තියේ පරිපාටිමය අවශ්‍යතාවයන් සපුරාලීමෙහිලා, බේරුම්කරණ ක්‍රියාදාමය මත විශ්වාසය තැබීමද කළ නොහැකිය.

රෙජිස්ට්‍රාර් හමුවේ බේරුම්කරණ ක්‍රියාදාමයෙන් අභියාචනයක් කිරීමේ හැකියාව බස්නාහිර පළාත් සමුපකාර සමිති ව්‍යවස්ථාවේ 58(3) වගන්තියෙන් අපේක්ෂිත නමුදු, අභියාචනයේ කටයුතු සඳහා චූදිතයෙකු විසින් රෙජිස්ට්‍රාර් හමුවේ පෙනී සිටීමේ හැකියාව 58(4) වගන්තිය සුපැහැදිලිවම අවුරා ලයි. ඒ අනුව, ආරාවුලක් ඇතිවූ සැණින්, පැමිණිලිකරුට ඇහුම්කන්දීමේ එකම අවස්ථාව උදා වන්නේ

බෙරුම්කරණ ක්‍රියාදාමයෙහිදීය. 44(6)(බී) වගන්තියෙහි අවශ්‍යතාවයන් සැළකිල්ලට ගැනීමේදී, එයද ආරම්භ වී ඇත්තේ නියමිත කාල සීමාව තුළ නොවන බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත සඳහන් කරුණු පදනම්ව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව යටතේ වන, නීතියේ රැකවරණයට ඇති අයිතිය වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශ :-

ඉහත සඳහන් කරුණු අනුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශයන් කරනු ලැබේ.

අ) පැමිණිලිකරු වෙත 2012.08.09 දින අධිභාරයක් පැනවීමේ සහ 2014.03.13 වන දින ඔහු වෙත එන්තරවාසියක් නිකුත් කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඉවත් විය යුතු බවටත්,

ආ) නීතිය යටතේ තහවුරු කොට ඇති සියළුම අදාළ පරිපාටිමය සහ සැළකිය යුතු මට්ටමේ රැකවරණයන් පැමිණිලිකරුට සහ වෙනයම් වූදිත පාර්ශ්වයන්ට සැලසෙන පරිදි විසඳාලීම පිණිස, මෙම ආරාවුල 1 වන 2 වන වගඋත්තරකරුවන්ට යොමු කළයුතු බවටත් මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

3/03

ම.හේ. නිමල් කරුණාසිරි,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/